# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,052 - 2017 දෙසැම්බර් මස 29 වැනි සිකුරාදා - 2017.12.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 5316 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2018 ජනවාරි මස 19 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 ජනවාරි මස 05 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

5315- B 81239— 5,403 (2017/12)
F 1 -

# පළාත් සභා නිවේදන

## සූරියවැව ප්‍රාදේශීය සභාව

### විනෝද බද්ද

(267 වන අධිකාරය වන) විනෝද බදු ආඥපනතේ දෙවන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර හම්බන්තොට දිස්ත්‍රික්කයේ සූරියවැව ප්‍රාදේශීය සභාව විසින් 2014.04.29 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක ඉ(2) යටතේ සම්මත කරන ලද පහත දක්වෙන යෝජනාව, 1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු විනෝද බදු ආඥපනතේ 2 වගන්තියේ (2) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර දකුණු පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය ගුස්තිඤ්ඤු වඩු ෂාන් විජයලාල් ද සිල්වා වන ම විසින් අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගුස්තිඤ්ඤු වඩු ෂාන් විජයලාල් ද සිල්වා,
මුදල්, ක්‍රම සම්පාදන, නීතිය හා සාමය,
ඉංජිනේරු සේවා, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය,
පළාත් පාලන, ප්‍රවාහන හා සංචාරක අමාත්‍ය.

2017 නොවැම්බර් මස 21 වැනි දින,
ගාල්ල,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

**යෝජනාව**

267 වැනි අධිකාරය වන විනෝද බදු ආඥපනතේ කාර්යය සඳහා වන කිසියම් විනෝද කටයුත්තක් සූරියවැව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සිදුකරන සෑම තැනැත්තෙකු විසින්ම එම විනෝද කටයුත්ත,

*(අ)* සිනමා දර්ශණයක් වන විට ඒ සඳහා ඇතුළත් කරගන්නා තැනැත්තන්ගෙන් අයකර ගන්නා මුදල් ප්‍රමාණයෙන් සියයට හතක (7%) ප්‍රමාණයට සමාන මුදලක්, සහ

*(ආ)* වෙනත් විනෝද කාර්යයක් වන විට ඒ සඳහා ඇතුළත් කරගන්නා තැනැත්තන්ගෙන් අයකර ගන්නා මුදල් ප්‍රමාණයෙන් සියයට විස්සක (20%) ප්‍රමාණයට සමාන මුදලක් ද,

ඉහත කී විනෝද බදු ආඥපනතේ 2 වැනි වගන්තියේ 1 වැනි උපවගන්තියේ පළාත් පාලන ආයතනවලට ලැබී ඇති බලතල ප්‍රකාර විනෝද බද්ද වශයෙන් පනවා අයකර ගත යුතු බවත්, එකී විනෝද කාර්යය පවත්වන දිනට පෙර එකී විනෝද බද්ද සූරියවැව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් සූරියවැව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

12-1099

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.